" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone 011 - 2093000

ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/19-1/FI/1(B) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.12. 01 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම් (බ.ප),
සභා ලේකම් (බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>බස්නාහිර පළාත් සංවර්ධන නිලධාරීන්ගේ කාර්ය මණ්ඩලය අනුමත කිරීම</u>

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව රැකියා විරහිත උපාධිධාරීන්/ඩිප්ලෝමාධාරීන් රැකියාගත කිරීම -2020 යටතේ රාජ්‍ය සේවා,පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය විසින් බඳවා ගනු ලැබූ සංවර්ධන නිලධාරීන්, බස්නාහිර පළාත් සභාව වෙත අනුයුක්ත කිරීම සිදු කරන ලදී.

02. ඒඅනුව,බස්නාහිර පළාත් සභාවේ සමස්ත ආයතන සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව සංවර්ධන නිලධාරීන් 4886කට අධික ප්‍රමාණයක් 2022.01.03 දින සිට මේ දක්වා බස්නාහිර පළාත් සභාව වෙත අනුයුක්ත කර ඇත. ඒ අනුව, දැනට අනුමත කාර්ය මණ්ඩලය තුළට අයත් නොවන අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම කළ යුතුව පවතී.

03. ඊට අදාළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ආයතනගත අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගනිමින් සංඛ්‍යාලේඛන කැඳවීමට නියමිතව ඇත. මේ වන විට ආයතන සඳහා අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් වරින් වර සිය සේවා ස්ථාන මාරු කිරීමේ කටයුතු සිදු කරනු ලබන බව වාර්තා වීම මත ඉහත අපේක්ෂිත නිවැරදි තොරතුරු සැපයීම ප්‍රබල අභියෝගයක් වී ඇති බව නිරීක්ෂණය වේ.

04. ඒ අනුව, සංවර්ධන නිලධාරි කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා ගන්නා තෙක්, 2022.12.01 දින සිට නැවත දැනුම් දෙන තුරු පහත සඳහන් ස්ථාන මාරු තාවකාලිකව අත්හිටුවීම සඳහා තීරණය කර ඇති බව කාරුණිකව දන්වමි.එනම්,

- අන්තර් පළාත් ස්ථාන මාරු
- මධ්‍යම රජයේ අනුරූපී තනතුරක් වෙත කරනු ලබන ස්ථාන මාරු
- පළාත තුළ සිදු කරනු ලබන ස්ථාන මාරු

05. ඒ අනුව, මේ පිළිබඳව ඔබ හා ඔබ යටතේ පවතින දෙපාර්තමේන්තු ආයතන වල සේවයේ නියුතු නිලධාරීන්ට දන්වන ලෙසත් ඊට අනුකූලව ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් කාරුණිකව දන්වමි.එමෙන්ම සුහද ස්ථාන මාරු සඳහා මෙම ලිපිය බාධාවක් කර නොගන්නා ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.ටී.ඒ.මානෙල්
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

පිටපත්
1. ලේකම්,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. - කාරු.දැ.ගැ.ස
2. අධ්‍යක්ෂ,කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - කාරු.දැ.ගැ.ස